# කතාබහ
## ජගත් ජේ එදිරිසිංහ

කතාබහ ඇරඹුණේ 2001 පෙබරවාරි මාසෙ සෙරන්ඩිබ් නිව්ස් පත්තරයට. ඕස්ට්‍රේලියාවෙ ශ්‍රී ලාංකික පත්තරයකට ලියවුණ පළමුවැනි කොලම කතාබහයි. ඉන්පස්සෙ අපි ඒක පහනට අරගෙන ගියා. එයින් පස්සෙ සන්නසට. අවුරුදු ගණනාවක් පුරා ලියවුණ කතා බහ දැනට අවුරුදු කීපයකට කලින් නැවතුණා. සන්නසේ පිටුවල ඉඩ මදිවෙන මාස වලදී අනිත් අයට ඉඩදෙන්න කතාබහ අයින් කරගන්න මට සිදුවුණා. දන්නෙම නැතුව කතාබව නැතුණේ එහෙමයි. කතා බහ ආයෙම ආරම්භ කරන්න බොහෝ අය ඉල්ලා සිටියත් ඒක මගේ අතින් කෙරුණෙම නැහැ. ඒත් දැන් ආයෙමත් කතා බහ ට පණ දෙන්න කාලය ඇවිලා කියලා මට හිතෙනවා. අපි ඉතින් ආයෙම ගමන් අරඹමු.

### පොතක් ගැන කතාවක්

2000 අවුරුද්දෙ දවසක බන්දු දිසානායක හිතවතාගෙන් දුරකතන ඇමතුමක් ලැබුණා.

"මල්ලි.. අපේ ඒකනායක මහත්තය කවි පොතක් ලියල තියෙනව. නව මැදිරි කවුළුවෙන් කියලා.. ඒක ඉක්මණට ප්‍රින්ට් කරගන්න ඕනෙ. පුලුවන්ද ලේ අවුට් කරලා පිට කවරෙත් කරලා දෙන්න?"



ඒකනායක මහත්තය කියල ඔහු හැඳින්නුවෙ වියත් ලේඛක එල් බී ඒකනායක මහතාවයි. මම ඒ කාලෙ ඔහු හඳුනන්නෙ නැහැ. නමුත් ඔහු ගැන අහල තිබුණා. ඒ කාලෙ ගුවන් විදුලියට සිංගරුපාය නාට්‍යය ලිව්වෙ ඔහු කියල මම දැනගෙන හිටියා. ඒ නිසා මම බොහොම කැමැත්තෙන් පොතේ වැඩේ බාර ගත්තා.

මේ කියන යුගයේ පරිගණකාශ්‍රිතව හරියාකාර සිංහල ෆොන්ට් එකක් වත් තිබුණෙ නැහැ. හොයාගන්න පුවන් හොඳම ෆොන්ට් එක වෙච්ච කළණි අකුරෙන් මම පොත වර්ණ සංයෝජනය (ටයිප්සෙට්) කළා. ඒ අතරේ වරින් වර දුරකතනයෙන් ඒකනායක මහත්තය එක්කත් කතා කළා. ඔහුට ඕනෑ වුණ පිටකවරය හදන්න අපට දිග සාකච්ඡා කරන්න වුණා. ඒ සාකච්ඡා නිසාම මේ වියත් ලේඛකයා පිළිබඳ හොඳ වැටහීමක් ලබා ගන්නත් ඔහුට සමීප වෙන්නත් මට වාසනාව ලැබුණා. ඒ වන විට ඔහු හිටියේ තදබල රෝගී තත්වයකින්. එයිටත් වඩා අපේ සමාජයේ ඊර්ෂ්‍යා-වෙන් සහ කුහක කමින් පිරුණ යම් යම් විෂම පුද්ගලයන් කීප දෙනකු විසින් ඔහුට එල්ල කරන ලද පුද්ගලික ප්‍රහාර නිසා ඔහු මානසික වැටීමකයි හිටියෙ. ඒ නිසාම ඔහු ඒ වන විට ලේඛණ කලාවට නැවතීමේ තිත තියලයි හිටියෙ.

නමුත් අප අතර කතාව ඉදිරියට යත්ම ඔහු උනන්දු කරන්නත් සෙරෙන්ඩිබ් නිව්ස් පත්තරයේ සිංහල අතිරේකයට ඔහුගේ යම් යම් නිර්මාණ ලබා ගන්නත් මට හැකි වුණා.

පොතේ පිටකවරය ඔහුට ඕනෑ ආකාරයට වරින් වර වෙනස් කරන්න මට සිදුවුණා. අවසානයේදී ඔහු ඒ ගැන ඉතා තෘප්තිමත් වුණා.

"මට අවශ්‍යම පිටකවරය ජගත් හැදුවා" ඔහු සතුටින් කිව්වා.

බන්දු අයියා ඇවිත් පොත අරගෙන ගියා මුද්‍රණය කරන්න. ඒ අතරේ ඒකනායක මහත්තයා ආයෙම අසනීප වුණා. රෝහල් ගත කළා.

"තත්වෙ හොඳ නැහැ.. අපි ඉක්මණට පොත ගහන්න ඕනෙ.." බන්දු අයියා කිව්වා.

පොත පිටවුණදාට පහුවෙනිදා මම ඒකනායක මහත්තයා බලන්න රෝහලට ගියා. ඔහු ඇඳ උඩ වාඩි වෙලා පොත් මිටිය ළඟින්ම තියාගෙන උන්නා. හරිම සතුටකින්. ඇඳ උඩ ඉන්න ගමන්ම මටත් පොතක් දුන්නා අත්සන් කරලා.

"අපි තව මොනා හරි ලියමු අන්කල්.." මම කිව්වා. ඔහුගේ ඇස් සතුටින් දිලුණා.

"ඔව් ජගත්.. මට දැන් ආයෙම ලියන්න හිතෙනවා.. ලියන්න දේවල් ගොඩක් හිතෙත් තියෙනවා.. අපි ලියමු.. මං පත්තරේට එවන්නම්.." ඔහු කිව්වා. මං හදවතින් අඬමින් ගෙදර ආවා. ඔහුට නැවත ලියන්නට කාලයක් ඉතිරිව නැති බව මං දැනගෙන හිටියා. වෛද්‍ය වරුන් ඔහුට දී තිබුණ කාලය තව පැය කීපයක් පමණක් බවත් මං දැන හිටියා.

පසුවදා ඔහු මිය ගිය පුවත මට ලැබුණා.

ඒ වටිනා මනුස්සයගෙ අන්තිම පැයේ ඔහුට සතුටක් දෙන්න මට හැකිවීම පිළිබඳ සතුටක් මගෙ හිතේ තාම තියෙනවා.

මගේ රාජාලි පියාපත කවි සංග්‍රහයට ඇතුළත් වුණ මේ කවිය ලියවුණේ ඔහු වෙනුවෙන්.

**ගිලන් යහනත**

නවා අතු පතර විලෝ ගස් පෙළ
සළා පිනි කඳුළු අතොරක් නැතිව අතු අගින්
බලා සිටියා ය විසල් ගොඩනැගිලි අබියස
මේ මහා රෝහල් බිමේ කෙළවරක

නවා ගත් හිස් ඇති මිනිසුන්
පුරා මෙ බිම සරා ගිය අයුර
නවවෙනි තට්ටුවේ වාට්ටුවේ
රෝගීව සිටි කවියා බලා සිටියේ ය

කුඩා මේසය කෙළවරක
කඩදාසි සහ පෑන ද
බලා සිටියේය වැළපෙමින්
අකර්මණ්‍යව සිටි කවියා දෙස

නොමිනිසුන් මිනිස් වෙස් ගත්
තලා දැමූ සිත රිදුම් දුනි
රෝගී වූ සෙල සියොළඟ පුරා
පීඩා දුන්නාට බෝ වැඩියෙන්

නොලිව් කවි පද සිරව හදවත තුළ
හඩා වැටුණා කළල වේසයෙන්
අලුත් කවි මල් පිපුණා ය රහසින්
ගිලන් යහනට ඉහළින්

ලියන්නට බොහෝ දේ ඉතිරිව ඇත
නොලියූ බොහෝ දේ ඇත සිත තුළ
ලියන්නට පටන් ගම් හෙටම
මහත් ආවේගයෙන් කීවේ ය කවියා
අවසන් හුස්ම හෙළූ දිනට පෙරදින

### සන්නිවේදනය

සෙරෙන්ඩිබ් නිව්ස් පත්තරයේ 2001 ජූනි මාසෙ කතාබහ ට ලියපු "සන්නිවේදනය" මැයෙන් වූ අදහස අදටත් ගැළපෙනවා. ඒ නිසා ඒක ඒ විදිහටම නැවත ලියන්න හිතුවා. මේ ඒ සටහනයි.

*"මෙයට අවුරුදු හයකට විතර කලින් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය සංවිධානය කළ සන්නි-වේදනය පිළිබඳ පාඨමාලාවකට සහභාගිවීමේ වරය මට ලැබුණා. මෙහිදී එක් දේශකයෙක් අපට ඉදිරිපත් කළ අපූරු උදාහරණයක් මට තාමත් මතකයි. ඔහු ඉතා සරළ වාක්‍යයක් ලිව්වා.*

*සරත් ඊයේ බයිසිකලයෙන් ගෙදර ගියේය.*

*"මේ වාක්‍යයට තේරුම් කීයක් තියෙනවද?" ඔහු ඇහුවා.*

*"එකයි" හැමෝම වගේ කිව්වා.*

*නමුත් මතුපිට වචන වලින් එක පාරටම පෙනෙන තේරුමට අමතරව මේ වාක්‍යයෙන් ගම්‍ය වන තේරුම් විශාල සංඛ්‍යාවක් තියෙනවා.*

*අපි කීපයක් අරගෙන බලමු*

*සරත් වෙනදට ගෙදර යන්නෙ නැහැ. ඒත් ඔහු ඊයෙ ගෙදර ගියා.*

*සරත් වෙනදට ගෙදර යන්නෙ බසයෙන් හරි කාරයකින් හරි වෙනයම් ක්‍රමයකින් හරි වෙන්න පුලුවන්. ඒත් ඔහු ඊයෙ ගෙදර ගියේ බයිසිකලයෙන්.*

*වෙනදට ගෙදර යන්නෙ සරත් නොවෙන්න පුලුවන්. ඒත් ඊයෙ ගෙදර ගියේ නම් සරත් තමයි.*

*සරත් වෙනදට වෙන කොහේ හරි යනව ඇති. ඒත් ඊයෙ නම් ඔහු ගෙදර ගියා.*

*කියවන්නා එක එක වචනයට තබන බර අනුව සරළ වාක්‍යයකට විවිධ අරුත් ලැබෙන් හැටි බලන්න.*

*අපි තවත් සංසිද්ධියක් අරගෙන බලමු. යාලුවන් හතරපස් දෙනෙක් ඉන්න තැන ඔබ කියනවා " කුමාර හරි හොඳ මනුස්සයා.." කියලා.*

*මෙතනදි එතැන ඉන්න කෙනෙක් එක පාරටම තේරුම් ගන්න පුලුවන් "ංආ... කුමාර නම් හොඳ මිනිහා.. ඒ කියන්නෙ අපි නරක මිනිස්සු කියන එක නේද?" කියලා.*

*මේ අවස්ථාවෙදි සන්නිවේදකයා කොහෙත්ම පාවිච්චි නොකළ වචන ඇති අර්ථයක් ග්‍රාහකයා ලබාගෙන තියෙනවා.*

*ඊළඟ අවස්ථාව තමයි සන්නිවේදකයා ගෙන යන පිණිවුඩය ග්‍රහණය කරගන්න හැකියාවක් ග්‍රාහකයන්ට නොතිබීම. ඒ වගේ අවස්ථාවක ග්‍රාහකයන් ග්‍රහණය කරගන්නෙ තම තමන්ගෙ බුද්ධි මට්ටමින් තේරුම් ගන්න පුලුවන් මොකක් හෝ දෙයක් පමණයි. අසරණ සන්නිවේදකයා හී-නෙකින් වත් නොහිතුව දෙයක් ග්‍රාහකයන් තේරුම් අරගෙන තිබෙන අවස්ථා අපට ඕනෙ තරම් හමුවෙනවා.*

*මම මේ උදාහරණ කීපය ලිව්වෙ සන්නිවේදනයේ තිබෙන අවදානම පිළිබඳ හැඟීමක් ඔබට දෙන්න"*

2001 දි ලිව්ව මේ ලියවිල්ල හැමදාටම වලංගුයි.

### ඔහු මලකි

වැඩකට යුරෝක් පන්සලට ගිය වෙලාවෙ මට මගේ පැරණි මිත්‍රයෙක් හමුවුණා. ඔහු ඇවිත් හිටියෙ අවුරුදු දහයක් පමණ වයසැති ඔහුගෙ පුතාත් එක්ක.

"අද පුතාගෙ උපන් දිනේ.. " මගේ මිත්‍රයා කිව්වා..

"ෂා.. හරිම අගෙයි.. අද එහෙනම් ගෙදර පාටියක් නේද..?" මං ඇහුවා.

මගේ මිත්‍රයා විතරක් නෙවෙයි අර පුංචි පුතාත් හිනාවුණා.

"දැන් අවුරුදු තුනක් විතර ඉඳන් පුතා බර්ත් ඩේ පාටි ඉල්ලන්නෙ නැහැ.. ඒ වියදම් කරන සල්ලි ලංකාවේ දුප්පත් ළමයෙකුට පොත් පත් යවන්න කියල තමයි පුතා කියන්නෙ.. ඉතින් අපි පාටියට යන සල්ලි වලින් පොත් පත් අරගන්නවා.. ලංකාවේ කවුරු හරි දුප්පත් ළමයෙකුට යවනවා.. අපි දැන් අවුරුදු දෙක තුනක ඉඳන් මේ වැඩේ කරනවා.." මගේ යාලුවා කිව්වා.

මං පුංචි පුතා දිහා බැලුවා.. ඔහු තවමත් හිනා-වෙනවා.. ඇත්තටම ඔහු මලකටත් වඩා සුවඳයි.

### හෙට අඳුරු නැහැ



"හෙට අඳුරු නැහැ" එහෙම කිව්වෙ මහාචාර්ය මුදියන්සේ දිසානායක. කිව්වෙ රංගන උදුම්බරා යුවල ඉදිරිපත් කළ රංගාභිෂේඛ නර්තන ප්‍රසංගය අතරදී. අපත් එතුමන් සමග එකඟයි.

රංගාභිෂේකයේ ඉදිරිපත් වුණ ඒ නර්තනාංග ඉතාම සිත්ගන්නා සුළුයි. නිර්මාණශීලීයි. අපේ සම්ප්‍රදායික නර්තනය ඇසුරු කරගිනිමින් කර තිබූ නව නිර්මාණ වෙනුවෙන් රංගන හා උදුම්බරා නර්තනවේදීන් දෙදෙනාට සියල්ලන්ගේම ප්‍රශංසාව හිමිවෙන්න ඕනෙ. පාරම්පරික නර්තනයේ ඇති ශක්තිමත් බව හා ගම්‍යතාව වේදිකාව මත මවන්නට ඔවුන් දැක්වූ සමත්කම සුවිශේෂයි.

මෙලිසා අධිකාරි, නිපුනි බණ්ඩාරනායක, නිපුනි දිසානායක, අමන්දා ජයතිලක, යසිරු කරුණාරත්න, අරුණි මාපා, කූෂාණි පෙරේරා, විනුෂි පෙරේරා, සචිනි පෙරේරා, ලංකා වික්‍රමාරච්චි කියන අපේ දූ වරුන් දසදෙනා මේ තරම් දුරට මේ ක්ෂෙත්‍රය තුළ කැන්දාගෙන එන්නට උදුම්බරා හා රංගන සෑහෙන කැපවීමක් කරන්නට ඇති බව නිසැකයි. ඒ කැපවීමේ මහඟු ප්‍රතිඵලය වන මිණි කැට වන් මේ දියණියන් දස දෙනා තවත් ඉදිරියට ගෙන යන්නට මේ යුවලට හැකිවේවායි පතන්නට මම කැමතියි.

එක් එක් නර්තනාංග අතර තිබූ විශාල කාල පරාස වසාලන්නට අවසන් භාගයේ දී මහාචාර්ය මුදියන්සේ දිසානායක ශූරීන් කළා සේ රසවත් පැහැදිලිකිරීම් වැනි අංග ඇතුළත් කළා නම් ප්‍රසංගයේ මඳ වේගී බව අඩු කරගන්නට තිබුණා කියලයි මට හිතුණෙ. අර Birth of the Baby Prince කියන අංගය ඇතුල් නොකළා නම් හොඳයි කියලා කීප දෙනෙකුම මා එක්ක කිව්වා. මටත් ඒකම හිතුණා.

ඒ කොයි හැටි වුණත් ඒ කිසිම දෙයකින් රංගාභි-ෂේක ප්‍රසංගයේ වැදගත් කම අඩු වෙන්නෙ නැහැ. සරළ වින්දනයක් ලබා දෙන ගීත නැටුම් වෙනුවට හරවත් යමක් දායාද කිරීම වෙනුවෙන් අපේ අත්පොළසම රංගන හා උදුම්බරාට හිමිවෙනවා. ඔබ වැනි දක්ෂයන් අපේ සමාජයට ආභරණයක්.